# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල


| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.01.22 පැය 1530 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/120/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

### හොකී තරඟ ජයග්‍රහණයක් - පොලිස් ක්‍රීඩා කොට්ඨාසය.

ධර්මදූත ආදී ශිෂ්‍ය සංගමය මගින් සිව්වන වරට සංවිධානය කරන ලද 2025 දූත සත් සාමාජික හොකී තරඟාවලිය 2025.01.17 වන දින සිට 2025.01.19 වන දින දක්වා බදුල්ල වින්සන්ට් ඩයස් ක්‍රීඩාංගනයේදී පවත්වන ලදී. මෙම තරඟාවලිය සඳහා ක්‍රීඩා සමාජ 24 ක් නියෝජනය කරමින් හොකී ක්‍රීඩා කණ්ඩායම් ක්‍රීඩකයින් සහභාගී වූ අතර ශ්‍රී ලංකා පොලිසිය නියෝජනය කරමින් කණ්ඩායම් 02 ක් සහභාගී වී ඇත.

එහිදි, පොලිස් ඒ කණ්ඩායම මෙම තරඟාවලියේදි අපරාජිතව අවසන් මහා තරඟයට සුදුසුකම් ලබා ශ්‍රී ලංකා ගුවන් හමුදා ඒ කණ්ඩායම සමඟ තරඟවැද ගෝල 01 – 01 ක් ලෙස සම ශූරතාවය දිනා ගන්නා ලදි. තරඟාවලියේ දක්ෂතම ක්‍රීඩකයාට හිමි කුසලානය ශ්‍රී ලංකා පොලිස් හොකී කණ්ඩායමේ කොන්ත්‍රාත් ක්‍රීඩක කුමාර ධර්මරත්න ක්‍රීඩකයා විසින් දිනා ගෙන ඇත.

පොලිස් හොකි කණ්ඩායමේ සභාපති ලෙස නියෝජ්‍ය පොලිස්පති ඉන්දික හපුගොඩ මහතා කටයුතු කරන අතර ලේකම් ලෙස සහකාර පොලිස් අධිකාරි උපුල් සමරසිංහ, පුහුණුකරු ලෙස ඒ.කේ පණ්ඩිතරත්න, කළමණාකරු ලෙස පොලිස් පරික්ෂක ලකිඳු රත්නායක සහ කණ්ඩායමේ නායකයා ලෙස උප පොලිස් පරික්ෂක එස්.එස් ප්‍රියලංක යන මහත්වරු කටයුතු කරනු ලබයි.

**මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්**













පොලිස් මාධ්‍ය කොට්ඨාසය.